## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පටිපාටිය - 2024

**1. ජ්‍යෙෂ්ඨතාවය** **උපරිම ලකුණු 45**

ශ්‍රී ලං.අ.ප.සේ. සේවා ව්‍යවස්ථාව ප්‍රකාර මූලික සුදුසුකම් යටතේ දක්වා ඇති ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ අනිවාර්ය වසර 05 ක සේවා කාලය හැර ශ්‍රී ලං.අ.ප.සේ. I ශ්‍රේණියේ අතිරේක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයට අදාළව වසරකට ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව වැඩිම අමතර සේවා කාලය සහිත නිලධාරියාට ජ්‍යෙෂ්ඨතාවය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ද ලකුණු හිමි වන පරිදි ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

සටහන : ශ්‍රී ලං.අ.ප.සේ. II ශ්‍රේණියේ වසර 02ක සේවා කාලයක් සහිතව II සහ III ශ්‍රේණි වල වසර 12කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරාලීමෙන් පසුව I ශ්‍රේණියට උසස්වීම් ලබා ඇති නිලධාරීන්ගේ, එම මුළු සේවා කාලය වසර 12ට සහ II ශ්‍රේණියේ වසර 02ට වඩා වූ අමතර සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ද I ශ්‍රේණියේ සේවා කාලයක් සේ සලකා ලකුණු ලබා දෙනු ලැබේ.

**2. අතිරේක අධ්‍යාපන සුදුසුකම්** **උපරිම ලකුණු 15**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනය මගින් ලබාගත් සුදුසුකම් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ

(බඳවා ගැනීමේදී හෝ කාර්යක්ෂමතා කඩඉම් සඳහා හෝ ශ්‍රේණි උසස්වීම් සඳහා හෝ මූලික සුදුසුකමක් ලෙස අදාල කරගෙන ඇති අධ්‍යාපන සුදුසුකම් සඳහා ලකුණු ලබාදෙනු නොලැබේ)

| | | |
|---|---|---|
| 2.1 | දර්ශනශුරි (PhD) | - ලකුණු 15 |
| 2.2 | දර්ශනපති (M Phil) | - ලකුණු 13 |
| 2.3 | පශ්චාත් උපාධිය | - ලකුණු 11 |
| 2.4 | පශ්චාත් උපාධිය ඩිප්ලෝමාව | - ලකුණු 09 |
| 2.5 | මූලික උපාධිය | - ලකුණු 07 |
| 2.6 | අධ්‍යාපන ක්ෂේත්‍රයට / බඳවාගත් විෂය ක්ෂේත්‍රයට අදාළව හදාරණ ලද ඩිප්ලෝමා | - ලකුණු 05 |
| 2.7 | වෙනත් ඩිප්ලෝමා | - ලකුණු 03 |

(උක්ත 2.6 හා 2.7 යටතේ ලකුණු ලබා දීමේ දී අදාළ ඩිප්ලෝමාවේ අධ්‍යයන කාලසීමාව අවම වශයෙන් පැය 450ක් හෝ මාස 9කට හෝ වැඩි විය යුතු අතර ඩිප්ලෝමාව ප්‍රදානය කරන ආයතනය රජයේ හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක් විය යුතුය)

**3. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම** **උපරිම ලකුණු 05**

(ප්‍රායෝගික භාවිතය පිළිබඳව සළකා බලනු ලැබේ. මෙහිදී අනු අංක 7 යටතේ සඳහන් කර ඇති පරිදි පරිගණකය භාවිතයෙන් Power Point ආශ්‍රයෙන් ඉදිරිපත් කිරීමක් කළ යුතු අතර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව office package ආශ්‍රයෙන් වෙනත් කාර්යයක් වුවද පරිගණකය භාවිතයෙන් සිදුකිරීමේ හැකියාව මැන බලනු ඇත)

**4. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය** **උපරිම ලකුණු 05**

(සන්නිවේදන කුසලතාවය සළකා බලනු ලැබේ. මෙහිදී කථන හැකියාව, කියවා යමක් අවබෝධ කරගෙන අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීමේ හැකියාව, ප්‍රශ්නවලට පිළිතුරු දීමේ හැකියාව මැන බලනු ඇත)

**5. අධ්‍යාපනයට අදාළ පර්යේෂණ සහ ප්‍රකාශන** **උපරිම ලකුණු 10**

5.1 පර්යේෂණ

i. තනි පුද්ගල පර්යේෂණ වාර්තා - ලකුණු $5 \times 2$
ii. කණ්ඩායම් පර්යේෂණ වාර්තා - ලකුණු $3 \times 2$

(පශ්චාත් උපාධියට / පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium) ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ)

5.2 පොත් හා සඟරා - ලකුණු $5 \times 2$

(පෙළපොත් හා ඒ ආශ්‍රිත පරිශීලන ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර, අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය මඟින් අනුමැතිය ලද තනි පුද්ගල කතෘ හිමිකාරීත්වයක් දරණ පොත් හා සඟරා සඳහා පමණක් ලකුණු ලබා දීමේදී සළකා බලනු ලැබේ)

*** උපරිම පර්යේෂණ හා / හෝ ග්‍රන්ථ දෙකක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.**

5.3 අධ්‍යාපන ප්‍රකාශන සඳහා ලබා දෙන ලද වාර්තා හා ශාස්ත්‍රීය සංග්‍රහ එකකට ලකුණු 02 බැගින් උපරිම 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

**6. සේවා ඇගයීම** **උපරිම ලකුණු 05**

අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතියට අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට අදාළව විධිමත් පරිදි නිකුත් කරන ලද අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් / ව්‍යාපෘතිවලට අදාළව නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා එකකට ලකුණු 01 බැගින් උපරිම සේවා ඇගයීම් 05ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

සටහන : දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු පළාත් ප්‍රධාන ලේකම්, පළාත් අධ්‍යාපන ලේකම්, විභාග කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වේ.

**7. ඉදිරිපත් කිරීම** **උපරිම ලකුණු 10**

සේවා ස්ථානයේ, (අධ්‍යාපන අමාත්‍යාංශය / ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව / පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / කලාප අධ්‍යාපන කාර්යාලය / කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය / පාසල) රාජකාරි ඉටු කිරීමේදී, අධ්‍යාපන පද්ධතියේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා මූලික වූ කරුණක් / අවස්ථාවක් / වැඩසටහනක් / ව්‍යාපෘතියක් පදනම් කරගෙන එය විශ්ලේෂණය කරමින් කරනු ලබන ඉදිරිපත් කිරීමක් සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.

i. ප්‍රවේශය හා හැඳින්වීම - ලකුණු 2
ii. අන්තර්ගතය - ලකුණු 4
iii. ඉදිරිපත් කිරීමේ කුසලතාවය - ලකුණු 2
iv. කාල කළමනාකරණය - ලකුණු 2

ඒ සඳහා පරිගණක ආශ්‍රයෙන් (Power Point) හෝ වෙනත් සුදුසු මාධ්‍යයකින් විනාඩි 05ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර සිදු කරනු ලබන ඉදිරිපත් කිරීමට අදාළ දෘඨ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබා දිය යුතු වේ.

**8. සම්මුඛ පරීක්ෂණයේදී දක්වනු ලැබූ සමස්ථ කුසලතාව** **උපරිම ලකුණු 05**

**100**